**අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදල - 2015**

---------------------------------------------------------------------

අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, සමුච්චිත අරමුදල වෙනස් වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2007 ජුලි 17 දිනැති අරමුදලේ භාර ඔප්පුවේ 22 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අධිකරණ යටිතල පහසුකම් හා නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

2015 දෙසැම්බර් 31 දිනට රු. 3,258,965 ක් වූ ජංගම ගිණුමේ ශේෂය, ස්ථාවර තැන්පතුවක් ලෙස ශේෂ පත්‍රයෙහිද, ස්ථාවර තැන්පතුවල ආයෝජන ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහිද දක්වා තිබුණි.

**2.3 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2007 ජූලි 17 දිනැති අරමුදලේ භාර ඔප්පුවේ 18 වගන්තිය | භාරකරුවන්ගේ රැස්වීම් අවම වශයෙන් සෑම මාස දෙකකට වරක් පැවැත්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණේ රැස්වීම් වාර 03 ක් පමණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2 ( ආ ) ඡේදය | අරමුදලේ අතිරික්ත මුදල් අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට පියවර ගත යුතු වූවත් ඊට පටහැනිව රු.3,258,965ක අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,354,320 ක අතිරික්තයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,869,167 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,223,487 ක වර්ධනයක් දැක්වුණි. රජයේ ප්‍රදාන රු.8,000,000 කින් වැඩිවීම හා යටිතල පහසුකම් නඩත්තු වියදම රු.1,955,393 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම අරමුදල 2007 ජූලි 17 දිනැති භාරකාර ඔප්පුවක් මගින් ස්ථාපිත කර තිබුණු අතර භාරකාර ඔප්පුවේ 1(A) අනුව අධිකරණ නිල නිවාස, ලේඛණාගාර, නඩුභාණ්ඩ කාමර, විනිසුරුවරුන්ගේ කාමර, රෙජිස්ට්‍රාර් කාර්යාල, නඩුකාරවරුන්ගේ පුස්තකාල සහ ඉහත

පරිශ්‍රයන්ට අදාල පොදු ස්ථාන වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීමත් ඉහත පරිශ්‍රයන්ට අදාල තොරතුරු තාක්ෂණ පහසුකම්, කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ සැපයීම ප්‍රධාන කාර්යය විය. එහෙත් සමාලෝචිත වර්ෂය තුළදී රු.12,344,558 ක් වටිනා පරිගණක උපාංග සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම පමණක් සිදුකර තිබුණු අතර අනෙකුත් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව අරමුදලේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) අධිකරණවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශයෙන් අධිකරණ පරිපාලනය වැය ශීර්ෂ 228 න් රු.814,000,000 ක් වැයකර තිබුණි. එම කාර්යයන් සඳහාම අධිකරණ අමාත්‍යාංශයෙන් 110-1-2-2201(03) වැය විෂය යටතේ මෙම අරමුදල සඳහා ප්‍රතිපාදන ලබා දී සමාලෝචිත වර්ෂයේ රු. 12,344,558 ක් පරිගණක උපාංග හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට වැය කර තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂයේ අගෝස්තු හා දෙසැම්බර් මාසවල පමණක් ගණුදෙනු සිදුව තිබියදී සම්පූර්ණ වර්ෂය සඳහාම වැඩබැලීමේ පදනම මත සිදුකල පත්වීම් වෙනුවෙන් දීමනා ලෙස රු. 226,198 ක් ගෙවා තිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

2014 වර්ෂයේ අමාත්‍යාංශයෙන් රජයේ ප්‍රදාන ලෙස අරමුදලට ලබාදුන් මුදලින් ඉතිරි වූ රු.883,863 ක මුදල 2015 අගෝස්තු 27 දක්වා නිෂ්ක්‍රීයව පැවති අතර සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයෙන් ප්‍රදාන ලෙස ලද රු.15,000,000 න් සියයට 21.7 ක් පමණ වූ රු.3,258,965 ක මුදල 2015 දෙසැම්බර් 31 වන විට අරමුණු සඳහා වැය නොකර ජංගම ගිණුමේ රඳවාගෙන තිබූ අතර 2016 මාර්තු මස 11 දින ස්ථාවර තැන්පතු තුනක ආයෝජනය කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

භාරයේ අරමුණු හා ඉලක්ක ලඟාකර කරගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සිදු කළ යුතු කාර්යයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

2009 වර්ෂයේ සිට අරමුදලේ කාර්යයන් පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 5.3 විගණන හා කළමනාකරණ කමිටුව

අරමුදල ආරම්භයේ සිටම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.